# පුරවැසි අධ්‍යාපනය
## 10 වසර
## II වාර පරීක්ෂණය

නම :- ............................................................ පන්තිය :-................ පන්ති අංකය :-.................

- වඩාත් නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01. ඈත අතීතයේ සිටම මිනිසා ජීවත් වීමට හුරු පුරුදුව සිටියේ,
    i) තනිවම ජීවත් වීමටය
    ii) කණ්ඩායමක් ලෙස ජීවත් වීමටය
    iii) සාමූහිකව ජීවත් වීමටය
    iv) ගෝත්‍රයක් ලෙස ජීවත්වීමටය

02. ශ්‍රී ලංකාව ඇතුළු ලෝකයේ බොහෝ රටවල් තම රටවල පාලනය සඳහා යොදා ගෙන ඇත්තේ,
    i) ෆැසිට්වාදී පාලන ක්‍රමයන්ය
    ii) සමාජවාදී පාලන ක්‍රමයන්ය
    iii) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයන් ය.
    iv) මින් එකක්වත් පිළිගත නොහැක

03. ග්‍රීසියේ පැවති සෘජු ප්‍රජාතන්ත්‍රවාදය යටතේ පාලනය සඳහා සහභාගි වීමට අවස්ථාව ලැබුණේ,
    i) නගර වැසි කාන්තාවන්ටය
    ii) වහලුන්ටය
    iii) විදේශිකයන්ටය
    iv) සියලු පුරවැසියන්ටය

04. උත්කෘෂ්ට විප්ලවය යන නමින් හඳුන්වනු ලැබුවේ,
    i) ඉංග්‍රීසි විප්ලවය ii) ප්‍රංශ විප්ලවය iii) ඇමරිකානු විප්ලවය iv) මින් එකක්වත් නොවේ

05. ප්‍රජාතන්ත්‍රවාදය යනු සියලු දෙනාටම අයිතිවාසිකම් හිමිවන පාලන ක්‍රමයක් ලෙස දක්වනු ලැබුවේ,
    i) හැරල්ඩ් ලැස්කිය ii) ඒබ්‍රහම් ලින්කන් ය iii) ටී.එච්.ග්‍රීන්ය iv) ඇරිස්ටෝටල් ය.

06. වර්තමානයේ බොහෝ රාජ්‍යය හඳුන්වා දිය හැක්කේ,
    i) එක් සංස්කෘතියකින් යුතු ජන සමාජයක් ලෙස ය.
    ii) ද්විත්ව සංස්කෘතියකින් යුතු ජන සමාජයක් ලෙස ය.
    iii) සංස්කෘතිකාංග වියැකී යන සමාජයක් ලෙස ය.
    iv) බහු සංස්කෘතික ජන සමාජයක් ලෙසය.

Learning Resource Centre
R
De Mazenod College
Kandana

07. ද්වි පක්ෂ ක්‍රමය පවතින ප්‍රබල රටක් ලෙස හඳුන්වා දිය හැක්කේ.
    i) චීනය ය. ii) කියුබාව ය iii) බ්‍රිතාන්‍ය ය iv) ඉන්දියාව ය

08. තරඟකාරී පක්ෂ ක්‍රමයක අයහපත් ලක්ෂණයක් වන්නේ,
    i) බහුවිධතාවය තුළින් භේදභින්නතාවය ඇති කිරීම.
    ii) ජනමතය නියෝජනයට ඇති ඉඩකඩ පුළුල් වීම.
    iii) අත්තනෝමතික පාලනයක් බිහිවීම නැලැක්වීම.
    iv) බහුවිධතාවය තුළින් එක්සත්බව ගොඩ නැගීම.

09. ලංකාවේ ඡන්ද කොට්ඨාශ බෙදා වෙන් කිරීමේ දී ප්‍රධාන නිර්නායකයක් ලෙස යොදා ගනු ලබන්නේ,

i) භූමිය හා සම්පත් ය.
ii) සම්පත් සහ වයස් ව්‍යුහය ය.
iii) භූමිය සහ ජනගහනය ය.
iv) භූමිය සහ වයස් ව්‍යුහය ය.

10. ලංකාවේ මැතිවරණ දිස්ත්‍රික් ගණන,

i) 20 කි. ii) 22 කි. iii) 24 කි. iv) 26 කි.

11. නිදහස් හා සාධාරණ මැතිවරණයක ලක්ෂණයක් නොවන්නේ,

i) මැතිවරණ නීති රීතිවලට අනුකූලව මැතිවරණ පැවැත්වීම.
ii) සාමකාමී මැතිවරණයක් තුළ මැතිවරණ පැවැත්වීම.
iii) නියමිත කාල සීමාව තුළ මැතිවරණ පැවැත්වීම.
iv) මැතිවරණ පැවැත්වීමට පෙර නොසන්සුන්කාරී වාතාවරණයක් නිර්මාණය කර ඒ දෙස සන්සුන්ව බලා සිටීම.

12. සමානාත්මක යන්නෙන් අදහස් කරනු ලබන්නේ,

i) සියලු දෙනාටම එක සමාන ලෙස සැලකීමය
ii) එක සමාන ලෙස පාන් ප්‍රමාණයක් සහ මස් ප්‍රමාණයක් ලබා දීමය
iii) සියලු දෙනාටම සමාන අවස්ථා ලබා දීමය
iv) අසමානතාවන්ට එරෙහිව නැගී සිටීමය

13. ප්‍රජාතාන්ත්‍රවාදී සමාජයක පැවැත්ම සඳහා නිදහස් මාධ්‍ය මඟින් ඉටු කළ යුතු කාර්යයක් නොවන්නේ,

i) සත්‍ය හා නිවැරදි තොරතුරු ජනතාව වෙත සැපයීම
ii) ජනතාවගේ දැනුම වර්ධනය කිරීම
iii) කාලීන තොරතුරු නිසි වේලාවට ජනතාවට ලබාදීම
iv) ජනතාව තුළ සාධාරණ කෝපය වර්ධනය වන ආකාරයට තොරතුරු ඉදිරිපත් කිරීම

14. ජාතික රාජ්‍යයක ප්‍රධාන ලක්ෂණයක් නොවන්නේ,

i) අභ්‍යන්තර හා බාහිර කටයුතු සම්බන්ධයෙන් ස්වාධිපති බලය අභිමිවීම
ii) එක් ජාතියක් එක් රාජ්‍යයක් යන සංකල්පය මත පදනම් වීම
iii) වෘත්තීය නිලබල පැලැන්තියකින් පාලනය මෙහෙයවීම
iv) භූමිය ජනගහනය, ආණ්ඩුව, ස්වාධිපති බලය යන අංගයන්ගෙන් සමන්විත වීම

15. ජාතික රාජ්‍යය බිහිවීමට බලපෑ හේතුවක් නොවන්නේ,

i) පුනරුදය
ii) විද්‍යාත්මක දැනුම වර්ධනය නොවීම
iii) රෙපරමාදු ආගමික ප්‍රතිසංස්කරණ
iv) වැඩවසම් ක්‍රමය බිඳවැටී ධනවාදී ආර්ථිකයක් ගොඩනැගීම

16. බලය පදනම් කරගෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වර්ගීකරණය කොට ඇත්තේ,

i) නම්‍ය හා අනම්‍ය වශයෙනි
ii) ලිඛිත අලිඛිත වශයෙනි
iii) ඒකීය සන්ධීය වශයෙනි
iv) සන්ධීය සහ සහසන්ධීය වශයෙනි

17. ව්‍යවස්ථාදායකය, විධායකය, අධිකරණය යන ආයතන දැක්විය හැක්කේ,

i) රාජ්‍යයේ සංයුතිය ලෙසය
ii) ආණ්ඩුවේ සංයුතිය ලෙසය
iii) බලයේ සංයුතිය ලෙසය
iv) ඒකීය රාජ්‍යයේ සංයුතිය ලෙසය

18. පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක ලක්ෂණයක් නොවන්නේ,

i) ව්‍යවස්ථාදායකය තුළින් විධායකය තේරී පත්වීමයි.
ii) විධායකය ඉවත් කිරීමට ව්‍යවස්ථාදායකයට හැකියාව තිබීමයි.
iii) විධායකය වෙනමම ඡන්දයෙන් පත්වීමයි.
iv) ව්‍යවස්ථාදායකය හා විධායකය අතර සෘජු සම්බන්ධතාවයක් පැවතීමයි.

19. ජනාධිපති ආණ්ඩුක්‍රමයක විශේෂ ලක්ෂණයක් නොවන්නේ,

i) රාජ්‍ය නායකයා මෙන්ම ආණ්ඩුවේ නායකයෙකු වන්නේ ජනාධිපතිවරයා ය.
ii) විධායකය ව්‍යවස්ථාදායකයට වගකීමට සාපුව බැඳී නැත.
iii) විධායක බලය හසුරුවනු ලබන්නේ ජනාධිපතිවරයා විසිනි.
iv) ව්‍යවස්ථාදායකය හා විධායකය අතර ඇත්තේ සමීප සම්බන්ධතාවයකි.

20. රජයේ වගකීම්වලට ඉදිරිපත් කළ හැකි නිදසුනක් නොවන්නේ,

i) නීතිය හා සාමය ආරක්ෂා කිරීමයි.
ii) පරිසරය ආරක්ෂාකොට සුරක්ෂිත කිරීම.
iii) සමාජ සුරක්ෂිතතාවය හා සුබසාධනය ඇති කිරීම.
iv) ජාතිවාදය ඇවිස්සීම තුළින් මැතිවරණවලට වාසි ලබා ගැනීම.

Learning Resource Centre
R
De Mazenod College
Kandana

21. ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක සාර්ථකත්වයට බෙහෙවින් හේතුවන කාරණාවක් වන්නේ,

i) ආණ්ඩුවට පක්ෂග්‍රාහී ජනතාවක් සිටීමය
ii) ආණ්ඩුවට හිතවත් ජනතාවක් සිටීමය
iii) දේශපාලන අවබෝධයකින් යුතු ජනතාවක් සිටීමය
iv) ආණ්ඩුවේ සෑම වැඩකටම සහයෝගය ලබාදෙන ජනතාවක් සිටීමය

22. මධ්‍යම ආණ්ඩුවක සතු පරිපාලන බලතල යම් ප්‍රමාණයක් ප්‍රාදේශීය පරිපාලන ඒකක වෙත පවරා දීම

i) බලය බෙදාහැරීම ලෙස හැඳින්වේ
ii) බලය විමධ්‍යගත කිරීම ලෙස හැඳින්වේ
iii) බලය කේන්ද්‍රගත වීම ලෙස හැඳින්වේ
iv) බලය එක් කිරීම ලෙස හැඳින්වේ

23. [illegible] රාජ්‍ය වල බලය බෙදාහැරීම හේතුවක් නොවන්නේ.

i) විවිධත්වය තුළ ඒකසත්ව ගොඩනගා ගැනීම සඳහා

ii) ජාතික ආරක්ෂාව තහවුරු කර ගැනීම සඳහා

iii) රාජ්‍යය විශාලත්වය හේතුවෙන් එක් මධ්‍යස්ථානයක සිට පාලන කටයුතු සිදු කිරීමේ අපහසුතාවය

iv) මින් එකක්වත් පිළිගත නොහැක

24. ප්‍රාදේශීය ආණ්ඩු හැඳින්වීම සඳහා 'කැන්ටන් ' යන පදය යොදාගනු ලබන්නේ,

i) ඇමරිකා එක්සත් ජනපදයේය

ii) ප්‍රංශයේය

iii) දකුණු ඉන්දියාවේ

iv) ස්විස්ටර්ලන්තයේය

25. සන්ධීය රාජ්‍යයක සාර්ථක පැවැත්ම සඳහා තිබිය යුතු අනිවාර්යය ගුණාංගයක් වන්නේ,

i) සියලු ජන කොටස් පොදු හැඟීමෙන් ක්‍රියා කිරීමය

ii) සියලු ජන කොටස් වෙන් වෙන්ව ක්‍රියා කිරීමය

iii) ව්‍යවස්ථාවන්ට අනුකූල නොවී කටයුතු කිරීමය

iv) මූල්‍යමය ආධාර වෙන වෙනම ලබා ගැනීමට වෙහෙස වීමය

26. ඒකීය ආණ්ඩුක්‍රමයක් පවතින රටකට ඉදිරිපත් කළ හැකි ප්‍රබල නිදසුනක් වන්නේ,

i) ඇමරිකා එක්සත් ජනපදය ii) ඉන්දියාව iii) ස්විස්ටර්ලන්තය iv) බ්‍රිතාන්‍යය

27. නීති පැනවීම සම්බන්ධයෙන් මධ්‍යම ආණ්ඩුවේ ව්‍යවස්ථාදායකය උත්තරීතර වන්නේ

i) ඒකීය රාජ්‍යයකය

ii) සන්ධීය රාජ්‍යයකය

iii) අර්ධ සන්ධීය ක්‍රමයකය

iv) සම්භව්‍ය සන්ධීය ක්‍රමයකය

28. සන්ධීය රාජ්‍යය විවිධත්වය තුළින් ඒකීයත්වය ළඟා කර ගැනීමට මඟ පාදන ආණ්ඩු ක්‍රමයක් ලෙස දක්වා ඇත්තේ,

i) ඒ.වී. ඩයිසිය

ii) කේ.සී. වියරේය

iii) හැරල්ඩ් ලැස්කිය

iv) ඇරිස්ටෝටල්ය

29. සන්ධීය ආණ්ඩු ක්‍රමයක වාසියක් නොවන්නේ,

i) ප්‍රජාතන්ත්‍රවාදී පාලන රාමුව ශක්තිමත් වීම

ii) විශාල රාජ්‍යවල පරිපාලන තීන්දු ගැනීමට පහසු වීම

iii) විවිධත්වයට ගරු කිරීම මඟින් පොදු ජාතිකත්වයක් ගොඩනගා ගැනීමට පහසු වීම

iv) ප්‍රාන්ත සඳහා පළපුරුදු නිලධාරීන් අවම වීම නිසා පරිපාලන ක්‍රමය බිඳවැටීමට ලක්විය හැක

30. ක්‍රි.ව. 1815 දී බ්‍රිතාන්‍යයන් විසින් පළාත් මට්ටමින් පත් කරනු ලැබුවේ,

i) ආණ්ඩුකාරවරයකු ය

ii) රෙසිඩන්ට්වරයකු ය

iii) විධායක නිලධාරියෙකි

iv) මධ්‍යම පළාතේ දිසාපතිය

24.07.2019
Grade-10
පුරවැසි.

කෙටි පිළිතුරු සපයන්න.

1) ශ්‍රී ලංකාවේ පළාත් ගණන කොපමණ ද? ඉන් තුනක් නම් කරන්න.
2) බණ්ඩාරනායක මහත්මා සහ චෙල්වනායගම් මහතා අතර බලය බෙදා හැරීම සම්බන්ධයෙන් යම් උත්සාහයක් ලෙස ගිවිසුමක් ඇති කර ගනු ලැබුවේ කිනම් වසරේ ද?
3) මධ්‍යම ආණ්ඩුව සහ පළාත් සභාව අතර සම්බන්ධීකරණය සිදු කරනු ලබන නිලධාරියා කවුරුන් ද?
4) ආණ්ඩුකාරවරයා සතු බලතල දෙකක් දක්වන්න.
5) ලංකාවේ පළාත් සභා ක්‍රමය ඇති කරන ලද්දේ කුමන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ ද?
6) සැලසුම් කිරීම ජාතික නිවාස සහ ඉදිකිරීම්, සමාජසේවා, කෘෂිකර්මය යන විෂයන් අයත් වන්නේ පළාත් සභා බලතල යටතේ කුමන ලැයිස්තුවට ද?
7) නගර සභාවක සහ මහ නගර සභාවක ප්‍රධානීන් හඳුන්වන නම් මොනවා ද?
8) ඇමරිකා එක්සත් ජනපදයේ පවතින්නේ කුමන ආණ්ඩුක්‍රමය ද?
9) ව්‍යවස්ථාදායකය විසින් විධායකය පත්වන්නේ කුමන ආණ්ඩු ක්‍රමයක් පවතින විටද?
10) ඇමරිකා එක්සත් ජනපදයේ සෙනට් සභාවේ සාමාජික සංඛ්‍යාව කොපමණ ද?

(ලකුණු 2 x 10 = 20)

Learning Resource Centre
R
De Mazenod College
Kandana

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

1) i. ප්‍රජාතන්ත්‍රවාදය යනු කුමක් ද?
   ii. ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රධාන ස්වරූපයන් මොනවා ද? ඒවා පිළිබඳව සැකෙවින් දක්වන්න.
   iii. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක දැකිය හැකි අංග ලක්ෂණ මොනවා ද?

2) i. දේශපාලන පක්ෂයක් යනු කුමක් ද?
   ii. දේශපාලන පක්ෂ වර්ග කොට දක්වන්නේ කෙසේ ද?
   iii. තරඟකාරී පක්ෂ ක්‍රමයක් පැවතීමෙන් අත්කර ගත හැකි වාසි මොනවා ද? (මෙහි යහපත් ලක්ෂණ මොනවා ද?)

3) i. ආණ්ඩු පක්ෂය සහ විරුද්ධ පක්ෂය යනු කුමක් ද?
   ii. ප්‍රජාතන්ත්‍රවාදී පාලනය සාර්ථක කර ගැනීම සඳහා විරුද්ධ පක්ෂයෙන් ඉටු විය යුතු කාර්යයන් මොනවා ද?
   iii. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් පවතින රටක ව්‍යවස්ථාවට අනුකූලව කටයුතු කිරීම නිසා ලැබෙන ප්‍රයෝජන මොනවා ද?

4) i. නිදහස් හා සාධාරණ මැතිවරණයක ලක්ෂණ මොනවා ද?
   ii. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පැවැත්ම සඳහා නිදහස් මාධ්‍යය මගින් ඉටු කළ යුතු කාර්යයන් මොනවා ද?

5) i. රාජ්‍යය යනු කුමක් ද? එහි අංග ලක්ෂණ මොනවා ද?

ii. ජාතික රාජ්‍යයක ප්‍රධාන ලක්ෂණ මොනවා ද?

iii. ජාතික රාජ්‍යය බිහිවීමට බල පෑ හේතු මොනවා ද?

6) i. බලය බෙදා හැරීම සහ බලය විමධ්‍යගත කිරීම යන්නෙන් අදහස් කරනු ලබන්නේ කුමක් ද?

ii. ලංකාවේ බලය විමධ්‍යගත කිරීමේ ඉතිහාසය පිළිබඳව ඔබට සඳහන් කළ හැකි කරුණු මොනවා ද?

iii. ලංකාවේ බලය බෙදා හැරීම සම්බන්ධයෙන් ගත් උත්සාහයන් මොනවා ද?

7) i. පළාත් ආණ්ඩුකාරවරයා පත් කරනු ලබන්නේ කෙසේ ද?

ii. පළාත් ආණ්ඩුකාරවරයාගේ බලතල හා කාර්යයන් මොනවා ද?

iii. පළාත් මහ ඇමතිවරයා පත් කරනු ලබන්නේ කෙසේ ද?

iv. පළාත් මහ ඇමති ඇතුළු අමාත්‍ය මණ්ඩලයේ කාර්යයන් මොනවාද?

8) i. බහු සංස්කෘතික ජන සමාජයක් යනු කුමක් ද?

ii. බහු සංස්කෘතික ජන සමාජයක මූලික ලක්ෂණ මොනවා ද?

iii. බහු සංස්කෘතික සමාජයක් බිහි වීම කෙරෙහි බලපා ඇති සාධක මොනවා ද?

iv. යහ පාලනය සංකල්පය මතුවීමට බලපෑ ප්‍රධාන හේතු මොනවා ද?